**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**I වාර පරීක්ෂණය - 2008**

**නාට්‍යකරණය හා රංග කලාව - 10 ශ්‍රේණිය**

**කාලය පැය 1**

## I පත්‍රය

**සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. අංග රචනය වඩා වැදගත් වන්නේ ...........
   - i. නාට්‍ය ධර්මී නාට්‍යයටය
   - ii. ගීත නාටකයටය
   - iii. ස්වාභාවික නාට්‍යයටය
   - iv. ජයමාන්න නාට්‍යටය

2. මූදු පුත්තු නාට්‍යයේ නිෂ්පාදක
   - i. එදිරිවීර සරච්චන්ද්‍ර මහතාය
   - ii. ලූෂන් බුලත් සිංහල මහතාය
   - iii. නීතිඥ චාල්ස් ඩයස් මහතාය
   - iv. ගුණසේන ගලප්පත්ති මහාතාය

3. ශෛලිගත හා ස්වාභාවික යන රංග භූමි දෙකම මිශ්‍ර කරගෙන නිෂ්පාදනය කරන ලද නාට්‍යයකි.
   - i. නරි බෑනා
   - ii. මනමේ
   - iii. සිංහබාහු
   - iv. වෙරිවත්ත

4. පහතරට ප්‍රදේශයේ යකුන් වෙනුවෙන් පවත්වනු ලබන යාතුකර්මයකි
   - i. කොහොඹාකංකාරිය
   - ii. පහන් මඩු
   - iii. සන්නියකුම
   - iv. දෙවොල් මඩු

5. වේදිකාව පසුපස ඇති සුදු බිත්තිය හෝ තිරය හඳුන්වන්නේ,
   - i. ගගනිකාව
   - ii. චිත්‍රවස්ත්‍ර නමිනි
   - iii. පැති තිරය නමිනි
   - iv. සුදු තිරය නමිනි

**<u>හරි වැරදි ලකුණු කරන්න.</u>**

6. කෝලම් යනු නාඩගම් විශේෂයකි. (................)
7. බම්මන්නා නූර්ති නාට්‍ය වල එන ප්‍රධාන චරිතයකි. (................)
8. දෙරකඩ අස්න නාට්‍ය ලක්ෂණ ඇති බෞද්ධ පූජා කර්ම වේ. (................)
9. රුක්මනී දේවී 'මිනර්වා' නාට්‍ය කණ්ඩායමේ ප්‍රසිද්ධ නිළියකි. (................)
10. වෙරි උයන බර්ඩෝල්ට් බ්‍රෙෂ්ට් ගේ අනුවර්තනයකි. (................)
11. නරි බෑනා නාට්‍ය හෙන්රි ජයසේනයන්ගේ නිර්මාණයකි. (................)
12. සොකරි උඩරට ගැමි නාට්‍ය විශේෂයකි. (................)

13. ශ්‍රියා මනමත්වී යන ගීතය නූර්ති යුගයේ රාමායණය නාට්‍යයේ ගීතයකි. (................)

14. වඩිගපටුන සබරගමු නැටුම් කලාවට අයත් වේ. (................)

15. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාටකයට අයත් චරිතයකි වැදිරජ (................)

16. 'ඉතින් සැනසෙන්න හොඳින් පුළුවන්නේ ' මෙම ගීතය ඇතුලත් නාට්‍ය

i. වෙස්සන්තර ii. කුවේනි iii. තලමල පිපිලා iv. නරිබෑනා

17. එම ගීතය ඇතුලත් නාට්‍ය රචනා කලේ,

i. ජයලත් මනෝරත්න ii. එදිරිවීර සරච්චන්ද්‍ර

iii. හෙන්රි ජයසේන iv. දයානන්ද ගුණවර්ධන

18. එත්තරන් නාට්‍යයේ එන ප්‍රධාන චරිතය වන්නේ

i. පුතාය ii. මැහැල්ල

iii. සොරමුලේ නායකයාය iv. ලේලිය

19. උපහාසය වඩාත් ප්‍රබල ලෙස දිස්වන්නේ පහත දැක්වෙන කවර නාට්‍ය සම්ප්‍රදයකද

i. නූර්ති ii. කෝලම් iii. සොකරි iv. නාඩගම්

20. පහත දැක්වෙන නාට්‍ය අතුරින් නාඩගම් සම්ප්‍රදයට අයත් වන්නේ කවරෙක්ද?

i. සබේවිදනේ ii. පොතේ ගුරු iii. කාරිය කරවන රාල iv. සුත්‍රධර

21. පහත දැක්වෙන නාට්‍ය අතුරින් නාට්‍ය ධර්මී සම්ප්‍රදයට අනුව රචනා වී ඇති නාට්‍ය කුමක්ද?

i. දෝනකතිරිනා ii. බෝඩිංකාරයෝ

iii. පේමතෝ ජායතී සෝකෝ iv. කැළණි පාලම

22. පහත දැක්වෙන කරුණු අතුරින් ආහාර්ය අභිනයට අයත් නොවන්නේ කුමක්ද?

i. නාට්‍ය ගීතය ii. වේෂභූෂණ iii. අංග රචනය iv. පසුතල නිර්මාණ

23. පහත දැක්වෙන නාට්‍ය අතුරින් ලෝක ධර්මී සම්ප්‍රදයට අනුව රචනා වී ඇති නාට්‍ය කුමක්ද?

i. ලෝම නාට්‍ය ii. රත්නාවලී iii. වෙරිවත්ත iv. ගජමන් පුවත

24. පරයා නම් චරිතය එන්නේ

i. ජස කෝලමේය ii. අණබෙර කෝළමේය

iii. සොකරි නාට්‍යයේය iv. නාඩගමෙහි එන පූර්ව රංගයේය.

25. නෘත්‍ය සඳහා අත්‍යවශ්‍ය නොවන අභිනය ප්‍රභේදය කුමක්ද?

i. ආංගික ii. වාචික iii. සාත්වික iv. ආහාර්ය

26. පහත සඳහන් රංගනයන් අතුරින් වාචික අභිනය අවශ්‍ය නොවන්නේ කුමකටද?

i. රූපනය ii. අභිරූපනය

iii. චරිත නිරූපනය iv. ක්ෂනික නිරූපනය

27. පහත දැක්වෙන රංගනයන් අතුරින් වාචික අභිනය අවශ්‍ය නොවන්නේ කුමකටද?

i. රූපනය ii. අභිරූපනය

iii. චරිත නිරූපනය iv. ක්ෂනික නිරූපනය

28. තොප්පි වෙළෙන්ද නාට්‍ය නිර්මාණ කලේ,

i. චන්ද්‍රසේන දසනායක ii. ජයසේකර අපෝන්සු

iii. සෝමලතා සුබසිංහ iv. ගුණසේන ගලප්පත්ති

29. දෙවොල් මඩු අයත් වන්නේ කවර නර්තන සම්ප්‍රදයකටද

i. උඩරට ii. පහතරට iii. සබරගමු iv. වැදි නැටුම්

30. නාඩගම් වල නළු කණ්ඩායමේ ප්‍රධානිය හඳුන්වන්නේ,

i. සෙල්ලම් ළමා ii. පොතේ ගුරාය iii. බහුභූතයාය iv. කෝළමාය

31. රංග භූමියකට ආලෝකය වඩාත් අවශ්‍ය වන්නේ,

i. රංග භූමියක් අලංකාර කිරීමය ii. රංග භූමියේ අඳුර මැකීමය

iii. රැගුම අර්ථවත් කිරීමටය iv. මේ එකක්වත් නොවේ

32. පහත දැක්වෙන නාට්‍ය අතුරින් පරිවර්තන හෝ අනුවර්තනයක් නොවන්නේ කුමක්ද?

i. ගුරු තරුව ii. මූදු පුත්තු iii. හරිම බඩුහයක් iv. මඟුල් ප්‍රස්ථාව

33. 'තානායම් පොළ' යනුවෙන් හැඳින්වෙන්නේ

i. නූර්ති රඟ දැක්වූ රංග භූමිය ii. කෝළම් රඟ දැක්වූ රංග භූමිය

iii. නාඩගම් රඟ දැක්වූ රංග භූමිය iv. සොකරි රඟ දැක්වූ රංග භූමිය

34. කරදිය නම් මුද්‍ර නාට්‍ය නිර්මාණය කලේ

i. කුලසිරි බුදවත්ත නර්තන ශිල්පියා ii. මුදියන්සේ දිසානායක නර්තන ශිල්පියා

iii. චිත්‍රසේන නර්තන ශිල්පියා iv. බැසිල් මිහිරිපැන්න නර්තන ශිල්පියා

35. යූ. ඇලෙක්ස් ගුණසේකර පරිවර්තනය කල මඟුල් ප්‍රස්තාව නාට්‍යයේ මුල් රචකයා

i. සැමුවෙල් බෙකට්ය ii. ඇන්ටන් චෙකොෆ්ය

iii. විලියම් ශේක්ස්පියර් iv. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ය

36. සිංහසීවලී සිංහබාහුගේ

i. දියණියයි ii. මවයි

iii. සොහොයුරියයි iv. මේ එකක්වත් නොවේ

37. ආහාර්ය අභිනය යනු

i. වචන භාවිතය ii. අංග ප්‍රත්‍යාංග මෙහෙය වීම

iii. මුහුණෙන් කරන රඟපෑමය iv. බාහිර ස්වරූපය සකසා ගැනීමය.

38. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයට වස්තු විෂය කරගනු ලැබුයේ

i. මහා පදුම ජාතකය ii. චන්ද කින්නර ජාතකය

iii. චුල්ල ධනුද්දර ජාතකය iv. සේරිවානිජ ජාතකය

39. ලෝකයේ දුක සැප නිරූපනය කර දක්වීම නාට්‍යය යනුවෙන් නිර්වචනය කලේ

i. භරත මුනි ii. ධනංජය iii. ඇරිස්ටෝටල් iv. ශේක්ෂ්පියර්

40. නාට්‍යකට අත්‍යවශ්‍ය අංගයක් නොවන්නේ,

i. සංවාදය ii. නළුවාය iii. වේදිකාවය iv. ප්‍රේක්ෂකයාය

**II පත්‍රය**

**කාලය පැය 1**

පළමු ප්‍රශ්ණය ඇතුළු ප්‍රශ්න 3කට පිළිතුරු ලියන්න.

1. i. 2008 නිවාසාන්තර නාට්‍ය උළෙලට නිවාස පහෙන් ඉදිරිපත් කළ නාට්‍ය පහේ නම් ලියන්න.

ii. ඒ නාට්‍ය උළෙලේ නාට්‍ය වල ගුණාත්මක බව හෝ අඩුපාඩු පිළිබඳව විවේචනයක් කරන්න.

(ලකුණු 20)

2. i. අභිනය වර්ග කීයද? ඒ මොනවාද?

ii. ඔබ නැරඹූ නාට්‍ය ඇසුරින් අභිනය යොදාගෙන ඇති ආකාරය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 20)

3. i. නාට්‍ය යනු කුමක්ද?

ii. නාට්‍යත් කතන්දරයත් අතර වෙනස පහදන්න.

(ලකුණු 20)

4. i. නරිබෑනා නාට්‍යයේ නිෂ්පාදකයා කවුද?

ii. එම නාට්‍යයේ ඔබ වඩාත් කැමති ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න.

(ලකුණු 20)

5. i. මහාචාර්ය සරච්චන්ද්‍රයන් මනමේ නාට්‍ය සඳහා පාදක කරගත්තේ කුමන ජාතකයද?

ii. සරච්චන්ද්‍රයන් නිෂ්පාදනය කළ නාට්‍ය පහක් ලියන්න.

iii. එතුමාගේ නාට්‍යක ගීතයක් ලියන්න.

(ලකුණු 20)

6. i. රංග අභ්‍යාස යනු කුමක්දැයි හඳුන්වන්න.

ii. රංග අභ්‍යාස කිහිපයක් හඳුන්වා රංගනයේදී රංගන ශිල්පියෙකුට එය අවශ්‍ය වන්නේ කුමක් සඳහා දැයි විස්තර කරන්න.

(ලකුණු 20)